සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S I

# තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 13 - 2019

විභාග අංකය ............................. ලංකා ඉතිහාසය I කාලය පැය එකයි

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- **I** කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු **II** කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. 1. දීඝගාම 2. අනුරාධගාම 3. තම්බපණ්ණි
4. උරුවේලගාම 5. උපතිස්ස ගාම (.....)

02. 1. වංස කථා 2. අටුවා 3. ධර්ම ග්‍රන්ථ
4. සඳකඩ පහණ 5. හටන් කාව්‍ය (.....)

03. 1. පාහියන්ගල 2. පොතාන 3. බටදොඹලෙන
4. අලවල ලෙන 5. බෙලිලෙන (.....)

04. 1. ගම්පොල 2. සිදුරුවාන 3. දෙනුවර
4. මාතලේ 5. සීතාවක (.....)

05. 1. ථූපාරාමය 2. මිරිසවැටිය 3. ලංකාරාමය
4. උත්තරාරාමය 5. ජේතවනාරාමය (.....)

06. 1. ගෝවින්ද මලය 2. මහානාගහුල 3. යාපහුව
4. මිනිපේ 5. දඹදෙණිය (.....)

07. 1. සෝල්බරිසාමි 2. ඩොනමෝර් සාමි 3. ජෙෆ්රි බට්ලර්
4. මැතිව් නාදන් 5. ඩ්‍රමන් ෂීල්ඩ් (.....)

08. 1. ලංකාලෝකය 2. සරසවිසඳරැස 3. මාසික තෑග්ග
4. සිංහල ජාතිය 5. සිංහල බෞද්ධයා (.....)

09. 1. හෙන්රි වෝඩ් 2. ෆන් එංගල්බෙක් 3. හර්කියුලීස් රොබින්සන්
4. විලියම් ගෙගරි 5. අතර් ගෝර්ඩන් (.....)

10. 1. පළමු රාජසිංහ 2. ශ්‍රී විජය රාජසිංහ 3. කීර්ති ශ්‍රී රාජසිංහ
4. රාජාධිරාජසිංහ 5. ශ්‍රී වික්‍රම රාජසිංහ (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11. 1. ඉතිහාසය යනු මිනිසා පිළිබඳ අධ්‍යයනයකි - ක්‍රිස් හර්ට්ස්
 2. මානව වර්ගයා අතර සිදුවූ සිදුවීම්වල කතාන්දරයයි - ජෝන් ජේ
 3. ඉතිහාසය යනු විෂයන් ගණනාවක එකතුවකි - ආර්.ජී. කොලින්වුඩ්
 4. ඉතිහාසය යනු ඔබේ සිතුවිලි නොව ඔබේ මතකයයි - ඩබ්.සී. සෙලර් හා ආර්.ජේ. යෙට්මැන්
 5. ඉතිහාසය යනු වර්තමානය හා අතීතය අතර සංවාදයකි - එඩ්වර්ඩ් හොලට් (.....)

12. 1. යාන් ඔය - හුරුළු වැව
 2. කදම්භ නදිය - යෝධ වැව
 3. ගෝණ නදිය - කලා වැව
 4. කප්පකන්දර නදිය - නාච්චදූව වැව
 5. ගම්භිර නදී - මහගල්කඩවල වැව (.....)

13. 1. සරජෝතිමාලෙයි - ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රය පිළිබඳ දෙමළ භාෂාවෙන් රචිත කෘතියකි.
 2. වංසත්තප්පකාසිනී - මහාවංසයට ලියන ලද ටීකා ග්‍රන්ථයකි.
 3. අමාවතුර - අනුරාධපුර යුගයේ රචිත ධර්ම ග්‍රන්ථයකි.
 4. කදවුරු සිරිත - දඹදෙණි රජවරුන්ගේ එදිනෙදා ජීවිතය පිළිබඳ රචිත කෘතියකි.
 5. වීරසෝලියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි. (.....)

14. 1. ධර්මපාල අස්ථාන කුමරු - දොන් ජුවන් පෙරිය බණ්ඩාර
 2. යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්
 3. කරලියද්දේ බණ්ඩාර - දොන් ජුවන් කැස්ත්‍රර්
 4. කොනප්පු බණ්ඩාර - ඔස්ත්‍රියාවේ දොන් ජුවන්
 5. කුසුමාසන දේවිය - දෝන කතිරිනා (.....)

15. 1. කෝල්බෘක් කැමරන් - පාසල් පරිපාලනය සඳහා පාසල් කොමිසම පත් කිරීම.
 2. කෘෘ මැකලම් - ව්‍යවස්ථාදායකය සඳහා උගත් ශ්‍රී ලාංකික නියෝජිතයෙක් පත්කිරීම.
 3. මැනිං - පළාත්බද ඡන්ද ක්‍රමය හඳුන්වාදීම.
 4. මැනිං ඩොවොන්ෂයර් - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් වැඩි ප්‍රමාණය මහජන ඡන්දයෙන් පත්කිරීම.
 5. සෝල්බරි - විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම. (.....)

- **අංක 16 සිට 20 තෙක් වූ ප්‍රශ්නය සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් x හා y තීරුවල දී ඇත. y තීරුවේ දී ඇති නාම/ දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. y තීරුව, x තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ප්‍රොකෝපියස් | A | ටොපොග්‍රැපියා ක්‍රිස්ටියානා |
| 2. | කොස්මස් ඉන්ඩිකොප්ලෙවුස්ටස් | B | ඩෙමුණ්ඩෝ |
| 3. | ඇරිස්ටෝටල් | C | සිංහලයේ ආණ්ඩු ක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන් |
| 4. | රිබෙයිරෝ | D | පර්සියානු යුද්ධ |
| 5. | ජෝන් ඩොයිලි | E | ලංකා ඉතිහාසය |

1. ABCDE  2. BCDAE  3. CDABE
4. DABEC  5. EBCAD (.....)

17. X | Y

| X | | Y | |
|---|---|---|---|
| 1. | අනුරාධපුරය | A | I බුවනෙකබාහු රජතුමා |
| 2. | පොළොන්නරුව | B | I විජයබාහු රජතුමා |
| 3. | දඹදෙණිය | C | VI පැරකුම් රජතුමා |
| 4. | යාපහුව | D | III විජයබාහු රජතුමා |
| 5. | කෝට්ටේ | E | පණ්ඩුකාභය රජතුමා |

1. ABEDC 2. BEDCA 3. CBADE
4. DECBA 5. EBDAC (.....)

18.

| X | | Y | |
|---|---|---|---|
| 1. | සූරතිස්ස | A | පළමුවන රාජ රාජ |
| 2. | අසේල | B | සත්ද්‍රවිඩ |
| 3. | වලගම්බා | C | සේනගුත්තික |
| 4. | පස්වන මිහිඳු | D | කාලිංග මාඝ |
| 5. | පරාක්‍රම පාණ්ඩ්‍ය | E | එළාර |

1. ACEBD 2. BAEDC 3. CEBAD
4. DABCE 5. ECBDA (.....)

19.

| X | | Y | |
|---|---|---|---|
| 1. | බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි | A | රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන |
| 2. | වලානේ සිද්ධාර්ථ හිමි | B | වාද විවාද පැවැත්වීම |
| 3. | හික්කඩුවේ සුමංගල හිමි | C | බෞද්ධ මුද්‍රණාල පිහිටවීම |
| 4. | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | D | පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන |
| 5. | රත්මලානේ ධම්මාලෝක හිමි | E | මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන |

1. CAEBD 2. BCEAD 3. CEDBA
4. DBECA 5. EBDCA

20.

| X | | Y | |
|---|---|---|---|
| 1. | දුම්කොළ වෙළෙඳාම රජයේ ඒකාධිකාරයක් බවට පත් කිරීම. | A | හෙන්රි වෝඩ් |
| 2. | රාජකාරි ක්‍රමය අහෝසි කිරීම. | B | රොබට් බ්‍රවුන්රිග් |
| 3. | වාරි කටයුතු නගා සිටුවීම. | C | එඩ්වර්ඩ් බාන්ස් |
| 4. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම. | D | පෙඩ්රික් නෝත් |
| 5. | කොළඹ - මහනුවර මාර්ගය ඉදිකිරීම. | E | වෙස්ට් රිජ්වේ |

1. ABDEC 2. BDAEC 3. CDBAE
4. DBAEC 5. ECBDA (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම,
    1. විවිධ ජන කණ්ඩායම් සංක්‍රමණය වීම.
    2. ස්වාධීන රාජ්‍යක් ලෙස වර්ධනය වීම.
    3. වෙළෙඳාම සඳහා ඇතැම් පිරිස් ලංකාවේ දේශපාලන බලය අල්ලා ගැනීම.
    4. දේශාටකයන්ගේ පැමිණීම.
    5. යුරෝපා ජාතීන්ගේ අවධානය ලංකාව දෙසට යොමුවීම. (.....)

22. අටුවා ග්‍රන්ථ
   1. අට්ඨකථා යනුවෙන් ද හැඳින්වීම.
   2. ත්‍රිපිටක ග්‍රන්ථවල කරුණු විස්තර කරමින් රචනා කිරීම.
   3. අටුවා ග්‍රන්ථ මුලින්ම පාලි භාෂාවෙන් රචනාකර තිබීම.
   4. වංසත්තප්පකාසිනිය මහා වංශයට ලියන ලද අටුවා ග්‍රන්ථයයි.
   5. ධර්මපාල තෙරුන් හා උපසේන තෙරුන් ප්‍රසිද්ධ අටුවාචාරීන් වෙති. (.....)

23. ගම්පොළ රාජධානිය,
   1. පස්වෙනි පැරකුම් රජු ගම්පොළ ආරම්භක පාලකයා වීම.
   2. ඉබන් බතුතාගේ ලංකාගමන.
   3. උතුරු ප්‍රදේශයේ ආර්ය චක්‍රවර්ති පාලකයන් බලවත්ව සිටීම.
   4. ගම්පොල රාජධානියට සමගාමීව දැදිගම තවත් පාලන මධ්‍යස්ථානයක් පැවතීම.
   5. අවසාන භාගයේදී චීන ආක්‍රමණයක් සිදුවීම. (.....)

24. ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය,
   1. කුරුඳු වෙළෙඳාමේ අයිතිය ලබාගැනීම ප්‍රධාන අරමුණ වීම.
   2. පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් ආර්ථික කටයුතු මෙහෙයවීම.
   3. සාම්ප්‍රදායික චාරිත්‍ර විධි ඇසුරින් අඩු වියදමකින් ලාභ ලැබීම.
   4. ආදායම් රැස්කිරීමේ කටයුතු සඳහා කලෙක්ටර්වරුන් පත් කිරීම.
   5. උඩරට රාජ්‍ය සමඟ අභ්‍යන්තර වෙළෙඳාම පවත්වාගෙන යාම. (.....)

25. බ්‍රිතාන්‍ය යුගයේ අධ්‍යාපනය,
   1. පැරිස් පාසල් මූලික කරගත් අධ්‍යාපන ක්‍රමයක් පැවරීම.
   2. මිෂනාරී සමාගම් අධ්‍යාපනය කෙරෙහි යොමුවීම.
   3. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන්ම අධ්‍යාපනය අධ්‍යාපනය ලබාදීම.
   4. කොළඹ ඉංග්‍රීසි විද්‍යාලයක් ආරම්භ කිරීම.
   5. ස්වභාෂා පාසල් පරිහානියට පත්වීම. (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
  B සහ C පමණක් නිවැරදිනම් 2 ද,
  C සහ D පමණක් නිවැරදිනම් 3 ද,
  A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදිය | B සහ C පමණක් නිවැරදිය | C සහ D පමණක් නිවැරදිය | A සහ C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පණ්ඩුකාභය රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද ?
   A - ආර්ය ජනපදිකයෙක් වීම.
   B - මාමාවරුන් පරාජයට පත්කොට බලය අත්පත් කරගැනීම.
   C - අගනගරය ලෙස අනුරාධපුරය ගොඩනැගීම.
   D - දිවයිනේ ග්‍රාම සීමා නියම කිරීම. (.....)

27. ශ්‍රී ලංකාවේ බුද්ධාගම ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේ ද ?
   A - මහින්දාගමනය
   B - බුදුන්වහන්සේගේ ලංකා ගමන
   C - අරිට්ඨ කුමරු සසුන්ගතවීම
   D - දෙවන ධර්ම සංගායනාව (.....)

28. කාලිංග මාඝගේ ආක්‍රමණය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද ?
   A - පස්වන මිහිඳු රජුගේ අවධියේදී සිදුවූ ආක්‍රමණයකි.
   B - පොළොන්නරු රාජධානිය බිඳවැටීමට හේතුවිය.
   C - පාලන මධ්‍යස්ථාන නිරිත දිගට සංක්‍රමණය වීම.
   D - මාඝගේ ආක්‍රමණයට එරෙහිව රෝහණ දේශයෙන් දැඩි විරෝධතාවක් එල්ලවිය. (.....)

29. යාපන රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A - 13 සියවසේ දී ජාවක චන්ද්‍රභානු විසින් යාපන අර්ධද්වීපය පාලනය කර ඇත.
   B - යාල්පාන වෛපවමාලෛ කෘතිය යාපන රාජ්‍ය පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රයකි.
   C - පස්වන පැරකුම් රජතුමා විසින් සපුමල් කුමරු යටතේ සටන් මෙහෙයවා යාපන ප්‍රදේශයේ බලය අත්පත් කර ගන්නා ලදි.
   D - 1619 වසරේදී ලන්දේසීන් විසින් යාපන ප්‍රදේශයේ බලය අත්පත් කරගන්නා ලදි. (.....)

30. උඩරට රාජ්‍ය බ්‍රිතාන්‍යයන් යටතට පත් කර ගැනීමට දරන ලද ප්‍රයත්න සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදිවේ ද ?
   A - මුහුදුබඩ ප්‍රදේශවල වැසියන් උඩරට රජු තම රජු ලෙස සැලකීම.
   B - ත්‍රිකුණාමලය හා කොළඹ අතර ගොඩබිම් මාර්ගය ඉදිකිරීම සඳහා උඩරට ස්වාධීන රාජ්‍ය බාධාවක් වීම.
   C - ක්‍රි.ව. 1800 දී මැක්ඩෝවල් සෙනෙවි උඩරටට යවා ඉංග්‍රීසින්ට වාසිදායක ගිවිසුමක් අත්සන් කිරීමට උත්සාහ කිරීම.
   D - ජෝන් ඩොයිලි යොදවා උපක්‍රමශීලිව උඩරට අල්ලාගැනීම සඳහා පසුබිම සකස් කිරීම. (.....)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. පෘතුගීසින් විසින් උඩරට රජු වශයෙන් පත් කරන ලද්දේ කවුරුන් ද ?
   1. මුත්තුසාමි කුමරු 2. කරලියද්දේ බණ්ඩාර 3. යමසිංහ බණ්ඩාර
   4. ඔස්ත්‍රියාවේ දොන් ජුවන් 5. වීරසුන්දර බණ්ඩාර (.....)

32. වැලිවිට සරණංකර හිමියන් හට සංඝරාජ පදවිය පිරිනමන ලද පාලකයා කවරෙක් ද ?
   1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 2. ශ්‍රී විජය රාජසිංහ රජු 3. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
   4. රාජාධිරාජසිංහ රජු 5. ශ්‍රී වික්‍රමරාජසිංහ රජු (.....)

33. ලන්දේසීන් විසින් යාපනයේ වැසියා සඳහා හඳුන්වාදෙන ලද නීතිය හඳුන්වන නම කුමක් ද ?
   1. රෝම ලන්දේසි නීතිය 2. මහම්මද් නීතිය 3. තේසවලාමේ නීතිය
   4. ඉංග්‍රීසි නීතිය 5. ශරීයා නීතිය (.....)

34. මෙරට සමාජයට බර්ගර් ජන වර්ගය එක් වූයේ කුමන ජන වර්ග දෙක අතර සිදුවූ මිශ්‍ර විවාහයන් නිසා ද ?
1. සිංහල හා ඉංග්‍රීසි 2. පෘතුගීසි හා ලන්දේසි 3. පෘතුගීසි හා සිංහල
4. ඉංග්‍රීසි හා ලන්දේසි 5. ඉංග්‍රීසි හා පෘතුගීසි (.....)

35. ''සිංහල සංගය'' හෙවත් ''සිංහල පෙරලිය'' නම් කැරැල්ලට මුහුණදීමට සිදු වූ පාලකයා කවුරුන් ද ?
1. vi පැරකුම් රජු 2. vi විජයබාහු රජු 3. viii වීර පරාක්‍රමබාහු රජු
4. vi බුවනෙකබාහු රජු 5. ix වෙනි ධර්ම පරාක්‍රමබාහු රජු (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර, පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. එතෙක් පැවති මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු ඇසුරින් මහානාම හිමියන් විසින් මහාවංසය රචනා කරන ලදී. | පැරණි මූලාශ්‍රවල දීර්ඝ තොරතුරු කෙටි කරමින් ද, කෙටි තොරතුරු දීර්ඝ කරමින්ද පුනරුක්ත දෝෂ ඉවත් කරමින් ද මහානාම හිමියන් මහා වංසය රචනා කළ බව එහි ආරම්භක ගාථාවේ සඳහන් වේ. (.....) |
| 37. වී, මුං, උඳු වැනි ධාන්‍ය වර්ග වර්තමාන බැංකුවලට සමාන ආයතනවල තැන්පත් කර තිබූ බවත් ඒ සඳහා පොලී ගෙවූ බවත් තෝනිගල ලිපියේ සඳහන්වේ. | මධ්‍යශිලා යුගයේ ජීවත් වූ මානවයා පොදුවේ බලංගොඩ මානවයා ලෙස හැඳින්වේ. (.....) |
| 38. ශ්‍රී ලංකාවේ රජරට ප්‍රදේශයේ බලය අල්ලාගත් චෝළයින් එහි අගනගරය ලෙස පොලොන්නරුව තෝරාගෙන එය මුම්මඩි චෝළ මණ්ඩලම් නමින් නම් කරන ලදි. | පළමු අග්බෝ රජ දවස දොළොස් මහා කවීන් වාසය කළ බව ජානකීහරණයේ සඳහන් වේ. (.....) |
| 39. කෝට්ටේ හතරවන පැරකුම් රජු තම මව වෙනුවෙන් කැරගල පද්මාවතී පිරිවෙන ඉදිකරන ලදී. | III වන පරාක්‍රමබාහු රජ සමයේ ජාතක කතා පොත සම්පාදනය කරන ලදී. (.....) |
| 40. හෙමීලියා වෙස්ටර්ට්‍රික්ස් නම් දිලීර රෝගය නිසා කෝපි වගාව පරිහානියට පත්විය. | තේ වගාව වතු වගාවක් ලෙස මුලින්ම හඳුන්වා දෙන ලද්දේ පෘතුගීසින් විසිනි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ ලංකා ඉතිහාසය II

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.
- පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් ප්‍රශ්න එක බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.

## A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) ඉරණමඩු වැව (ii) මාතොට (iii) මඩකලපුව (iv) කිරිදි ඔය
(v) රාවණා ඇල්ල (vi) මණිහිරවාපී (vii) මහානාගහුල (viii) නැගෙනහිර පළාත
(ix) අඹන් ගඟ (x) යාපහුව (xi) උපතිස්සගාම (xii) බලන

(ල. 12)

## B කොටස

02. ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරීමේ වැදගත්කම සාහිත්‍ය මූලාශ්‍රය මහා වංසයයි. පහත සඳහන් මාතෘකා යටතේ ඉහත ප්‍රකාශය විමසන්න.

(i) මහා වංසයේ වැදගත්කම
(ii) මහා වංසයේ සඳහන් තොරතුරු වෙනත් මූලාශ්‍රය මඟින් තහවුරු වන අවස්ථා
(iii) මහා වංසයේ දුර්වලතා (ල. 16)

03. පූර්ව රාජ සමයේ සිට ශ්‍රී ලංකාවේ වාරි මාර්ග ක්‍රමයේ හා වාරි තාක්ෂණයේ ක්‍රමික වර්ධනය පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

04. පළමු විජයබාහු රජතුමාගෙන් පසු අවුල් සහගත තත්වයට පත් ශ්‍රී ලංකාවේ දේශපාලනය ස්ථාවර තත්වයකට පත් කිරීමේ ගෞරවය හිමිවන්නේ පළමු පැරකුම් රජු හටය.

(i) පළමු පැරකුම් රජු උපන් ස්ථානයේ ඉදිකර ඇති දාගැබ කුමක් ද ? (ල. 1)
(ii) පළමු පැරකුම් රජුගේ මව හා පියා නම් කරන්න. (ල. 2)
(iii) පළමු විජයබාහු රජුට පසුව ශ්‍රී ලංකාවේ බිහි වූ පරිපාලන ප්‍රදේශ හතර නම් කර එහි පාලන මූලස්ථාන නම් කරන්න. (ල. 4)
(iv) පළමු පැරකුම් රජු ලංකාව එක්සේසත් කොට ආර්ථික සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ල. 9)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගය හා ජනාවාස

(ii) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දේශපාලන හා ආගමික වැදගත්කම

(iii) රජරට ශිෂ්ටාචාරයේ පාලන තන්ත්‍රය

(iv) පශ්චාත් පොළොන්නරු යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍ය (එක් කොටසකට ල. 8 බැගිනි)

## C කොටස

06. ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ පැවති පෘතුගීසි පාලනය අවසන් කළ ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ බලය අත්පත් කරගන්නා ලදී.

(i) II රාජසිංහ රජු 1638 වසරේදී ගිවිසුමකට එළැඹී ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ නියෝජිතයා කවුරුන් ද ? (ල. 1)

(ii) ලන්දේසි යටත් විජිත ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙක නම් කරන්න. (ල. 2)

(iii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ලන්දේසි පාලන ප්‍රතිපත්තිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(iv) ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ ලන්දේසි පාලනය නිසා ඇති වූ සමාජ සංස්කෘතික වෙනස්වීම් පිළිබඳ විස්තර කරන්න. (ල. 8)

07. යුරෝපා ජාතීන්ගේ තර්ජන හමුවේ දීර්ඝ කාලයක් ස්වකීය ස්වාධීනත්වය ආරක්ෂා කරගත් උඩරට රාජධානිය 1815 දී බිඳ වැටුනි. පහත සඳහන් මාතෘකා ඇසුරින් සාකච්ඡා කරන්න.

(i) පෘතුගීසින් ලන්දේසීන් හා මහනුවර රාජධානිය

(ii) බ්‍රිතාන්‍ය ජාතිකයන් හට උඩරට රාජධානිය අල්ලා ගැනීමට අවශ්‍ය වීමට හේතු

(iii) බ්‍රිතාන්‍ය ජාතිකයන්ට උඩරට බලය පහසුවෙන් අත්පත් කරගැනීමට හැකිවීමට බලපෑ සාධක (ල. 16)

08. පහත සඳහන් මාතෘකා යටතේ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ විශේෂතාවයන් පිළිබඳ විමසන්න.

(i) හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණයන්

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දුර්වලතා (ල. 16)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) 1848 නිදහස් සටන

(ii) මිෂනාරී ව්‍යාපාරයට එරෙහි බෞද්ධ පුනරුද ව්‍යාපාරය

(iii) වතු ආර්ථිකයේ ආරම්භය හා වර්ධනය


(iv) 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

# තෙවන වාර පරීක්ෂණය - 2019
## ඉතිහාසය - 13 ශ්‍රේණිය
### පිළිතුරු - I කොටස

| | | | |
|---|---|---|---|
| 1. 1 | 11. 3 | 21. 2 | 31. 3 |
| 2. 4 | 12. 4 | 22. 3 | 32. 1 |
| 3. 2 | 13. 3 | 23. 1 | 33. 3 |
| 4. 5 | 14. 3 | 24. 4 | 34. 2 |
| 5. 4 | 15. 5 | 25. 1 | 35. 4 |
| 6. 2 | 16. 4 | 26. 5 | 36. 5 |
| 7. 1 | 17. 5 | 27. 4 | 37. 2 |
| 8. 3 | 18. 3 | 28. 2 | 38. 4 |
| 9. 2 | 19. 1 | 29. 1 | 39. 3 |
| 10. 1 | 20. 2 | 30. 3 | 40. 1 |

### II කොටස

### A කොටස




### B කොටස

02. * මහා වංසය ක්‍රි.ව. 5/6 සියවස් වලදී මහානාම හිමියන් විසින් රචනා කර ඇති බව.
 * බුද්ධ කාලයේ පටන් මහසෙන් රජුගේ රාජ්‍ය කාලය අවසානය දක්වා දේශපාලන, ආගමික, සමාජ, සංස්කෘතික තොරතුරු රැසක් අනාවරණය කරගත හැකි බව.
 * මහා වංසයේ සඳහන් එම තොරතුරු වෙනත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් තහවුරු වන අවස්ථා උදාහරණ දෙමින් විස්තර කර තිබීම.

* ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රයක් ලෙස මහා වංශයේ පවතින දුර්වලතා විස්තර කර තිබීම.
  (12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 24 - 27 පිටුව දක්වා)

03. * වැව් ඉදිකිරීමේ ඉතිහාසය.
* පූර්ව රාජ සමයේ දී වැසි ජලය ගබඩාකර තබාගැනීමේ අරමුණින් ගම් වැව් ඉදිකිරීම.
* ගම්වැව් ඉදිකිරීමේදී ගමේ නායකයාගේ කාර්ය භාරය විස්තර කිරීම.
* ගම් වැව්වල ජලය ප්‍රමාණවත් නොවූ විට ගම් වැව් පද්ධති ඉදිකළ බව.
* පණ්ඩුකාභය රජතුමා මුලින්ම වැව් ඉදිකිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් පාලකයා වීම. ඔහු ගාමිණී වැව ජයවැව හා අභය වැව කරවීම.
* වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වේගවත් කිරීම සඳහා මහා වැව් ඉදිකළ බව.
* මහ වැව් ඉදිකිරීම ආරම්භ කළ පළමු පාලකයා වසභ රජු බව.
* කුඩා වැව් ඉදිකිරීමේදී සරල තාක්ෂණික උපක්‍රම භාවිත කළ බව.
* මහ වැසි ඉදිකිරීමේදී දියුණු තාක්ෂණික ක්‍රම භාවිතා කළ බව.
* වැවක අංග නම් කර ඒවායෙන් ඇති ප්‍රයෝජන විස්තර කර තිබීම.
* වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය සඳහා අනුග්‍රහ ලබාදූන් පාලකයින් හා ඔවුන් ඉදිකළ වාරි ඉදිකිරීම් පිළිබඳ විස්තර සපයා තිබීම. (ල. 16)

04. (i) දැදිගම කොටවෙහෙර (ල. 1)
(ii) පියා - මාණාභරණ | මව - මහා රත්නාවලී දේවී (ල. 2)
(iii) රජරට - පොළොන්නරුව | දක්ෂිණ දේශය - පුංඛග්‍රාමය
දොළොස් දහස් රට - මහානාගහුල | අටදහස් රට - උඳුන්දොර (ල. 4)
(iv) * මුලින්ම දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් බලයට පත්ව ඉටුකළ කාර්යභාරයන් විස්තර කර තිබීම.
* රජරට බලය ලබාගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග විස්තර කිරීම.
* පොළොන්නරුවේ දේශපාලන බලය අත්පත් කර ගැනීම සඳහා II ගජබාහු හා II මාණාභරණ ඇතුළු පිරිස් සමඟ සිදු වූ සටන් ව්‍යාපාර පිළිබඳ විස්තර කර තිබීම.
* ලංකාවම එක්සේසත් කිරීම සඳහා සුගලා දේවිය සමඟ සිදුවූ සටන් පිළිබඳ විස්තර කිරීම.
* දක්ෂිණ දේශයේ පාලකයා ලෙසත් ලංකාවේම පාලකයා ලෙසත් වැව් අමුණු ඉදිකරමින් වගා කටයුතු සංවර්ධනය කරමින් ආර්ථික සංවර්ධනයට ගත් ක්‍රියාමාර්ග විස්තර කිරීම. (ල. 9)

05. (i) ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගය හඳුන්වා එහි ජනාවාස පිළිබඳ විස්තර කර තිබීම.
(ii) දේවානම්පියතිස්ස රජතුමා ඉන්දියාව සමඟ පැවැත්වූ සබඳතා එහි එසේ සබඳතා පැවැත්වීමට හේතු විස්තර කිරීම.
* මෞර්ය පාලන ක්‍රමය * මෞර්ය අභිෂේක ක්‍රමය
* රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ පාලන සංකල්ප එක්වීම.
* රාජ්‍ය පාලනය මධ්‍යගත වීමට ගත් ක්‍රියාමාර්ග.
* මහින්දාගමනය / සංඝමිත්තාගමනය
* බුදු දහම, භික්ෂු ශාසනය, භික්ෂුණී ශාසනය පිහිටුවීම.
* ධාතු වන්දනය හා බෝධි වන්දනය ආරම්භ වීම.
* වෙහෙර විහාර ඉදිකිරීම හා රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
(iii) අනුරාධපුර යුගයේ පාලන ක්‍රම පොළොන්නරු චෝල පාලන සමයේ දී හා පොළොන්නරු රාජධානි සමයේ දී පාලනය සිදුවූ අයුරු විස්තර කර තිබිය යුතුය.
(ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 12 ශ්‍රේණිය 61 - 62 පිටු)
(iv) දඹදෙණි, යාපහුව, කුරුණෑගල, ගම්පොල ආදී යුගවලදී සිදු වූ අධ්‍යාපනික හා සාහිත්‍ය අංශයේ දියුණුව පිළිබඳ විස්තර කර තිබිය යුතුය. (එක් කොටසකට ල. 8 බැගිනි)

## C කොටස

06. (i) අද්මිරාල් වෙස්ටර් වෝල්ට් (ල. 1)
(ii) ආර්ථික අරමුණු (වෙළෙඳාමෙන් ලාභ ලැබීම) | ආගමික අරමුණු (ආගම ප්‍රචාරය කිරීම) (ල. 2)
(iii) * ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ ලන්දේසි පාලනයේ ප්‍රධාන අරමුණ වූයේ වෙළෙඳාමෙන් ලාභ ලැබීම හා ආගම ප්‍රචාරය කිරීමයි. එම අරමුණු ඉටු කරගැනීම සඳහා ඔවුන් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කරන ලදි.

* අඩු වියදමින් වැඩි ලාභ ලැබීමේ ක්‍රමයක් අනුගමනය.
* පාලන කටයුතු සඳහා දේශීය පාලන ක්‍රම යොදා ගැනීම.
* පරිපාලනයේ ඉහළම තනතුරු ලන්දේසි ජාතිකයන්ට හිමිවීම.
* බතාවියේ ආණ්ඩුකාරතුමා ඔහුගේ උපදේශක සභාව ගාල්ලේ ආණ්ඩුකාර තුමා හා ඔහුගේ උපදේශක සභාව.
* කොමාන්ඩරි තුනක් යටතේ කොමදෝරුවරු පත්කර පාලන කටයුතු මෙහෙයවීම.
* නව උසාවි පද්ධතියක් හා නීති රීති සමූහයක් හඳුන්වා දීම. (ල. 5)

*(ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - 13 ශ්‍රේණිය 18 පිටුව)*

(iv)* රෝම ලන්දේසි නීතිය හඳුන්වාදීම නිසා බහු විවාහ ක්‍රම වෙනුවට එක විවාහ ක්‍රමය ඇතිවීම.
* කුල ක්‍රමය පදනම් කරගත් සමාජ ක්‍රමය වෙනස් වීම.
* පෘතුගීසි ලන්දේසි මිශ්‍ර විවාහ නිසා බර්ගර් ජන වර්ගය එක්වීම.
* ලන්දේසි භාෂාවේ අංග, ආහාරපාන වර්ග, ගෘහ නිර්මාණ ශිල්පය ලංකාවේ සංස්කෘතියට එක් වීම.
* බටහිර වෛද්‍ය සේවය හඳුන්වා දීම.
* මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දීම.
* ලාදුරු රෝග නිවාරණයට ලාදුරු රෝහල් ඉදිකිරීම. (ල. 8)

*(ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - 13 ශ්‍රේණිය 18 පිටුව)*

07. * පෘතුග්‍රීසින් හා ලන්දේසින් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල බලය අල්ලා ගැනීම සහ ඔවුන් උඩරට රාජධානිය සමඟ පැවැත් වූ සබඳතා විස්තර කර තිබීම. ඔවුන්ට කිසි විටකත් උඩරට රාජධානිය අල්ලා ගැනීමට නොහැකි වූ බව. ලන්දේසීන්ගෙන් පසු ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ බලය ඉංග්‍රීසින් යටතට පත් වූ අයුරු හා බ්‍රිතාන්‍ය ජාතිකයන්ට උඩරට රාජධානිය අල්ලාගැනීමට අවශ්‍යවීමට බලපෑ හේතු විස්තර කර තිබීම. එසේම උඩරට රාජධානිය තුළ උද්ගත වූ බල අරගලය හා අවුල් සහගත පාලන තත්වය බ්‍රිතාන්‍ය ජාතිකයන්ට උඩරට රාජධානියේ බලය අත්පත් කරගැනීමට පහසු වීමට බලපෑ බව පැහැදිලි කිරීම. එහිදී උඩරට රජුගේ, රදළවරුන්ගේ හා ඉංග්‍රීසින්ගේ ක්‍රියාකලාපයන් රට බලපෑ ආකාරය විස්තර කිරීම වැදගත්වේ.
* පෘතුගීසින් හා ලන්දේසීන් සටන් හා ගිවිසුම් මගින් උඩරට රාජ්‍ය අල්ලා ගැනීමට උත්සාහ දැරීම.
* පෘතුගීසින් හා ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීමට හැකි වුවද මහනුවර රාජධානිය අල්ලා ගැනීමට අපොහොසත් වීම. (ල. 16)

08. * රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම. * විධායක කාරක සභා ක්‍රමය.
* ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීමට ගත් ක්‍රියාමාර්ග.
* රාජ්‍ය නිලධාරීන් තිදෙනා. * වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.
* සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම. * පලාත්බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම. ආදී ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ විස්තර කර තිබීම.

**දුර්වලතා**
* ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනාහට වැදගත් අමාත්‍යංශ පැවරී තිබීම.
* විධායක කාරක සභා ක්‍රමය නිසා පාලන කටයුතු සිදු කිරීම ප්‍රමාද වීම.
* ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අපහසු වීම.

*(ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය - 13 ශ්‍රේණිය 49 පිටුව)*

09. කෙටි සටහන් සඳහා සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න.